# පුස්කොළ පොත් එකතු පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක්.

## (කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදී විහාරය සහ ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය අළුතැපොල ගනේකන්ද රජමහා විහාරය ඇසුරෙනි)

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
10 JUN 2013
UNIVERSITY OF KELANIYA

ලැගුම්දෙණියේ පියරතන හිමි

FGS/L/MSSc/2007/18



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 813 |
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

2012

# සාරාංශය

මේ පර්යේෂණයේ අරමුණ වුයේ ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක යෙදීම යි. සමස්ත දිවයින ආවරණය කළ නොහැකි බැවින්, මෙහිදී පුස්කොළ පවතින ප්‍රධාන විහාරස්ථාන දෙකක් නියැදිය වශයෙන් තෝරා ගනු ලැබිණි. එම තෝරා ගැනීම සිදු කරන ලද්දේ දිස්ත්‍රික්ක හා ඓතිහාසික කාල පරිච්ජේද පදනම් කර ගෙන ය. මෙහි එක් විහාරස්ථානයක් වු රිදී විහාරය කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි අතර එහි ඉතිහාසය අනුරාධපුර යුගය දක්වා දිව යයි. අළුතැපොළ රජමහා විහාරය ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි අතර එය 18 සියවසේදී පමණ ආරම්භ වුවක් සේ සැලකේ. මේ අනුව අදාළ නියැදියෙන් පොදුවේ දිවයිනේ පුස්කොළ පොත් එකතුවල ග්‍රන්ථ විද්‍යාත්මක තත්ත්වයන් පිළිබඳව සාධාරණීකරණයක් කළ හැකි යැයි අපේක්ෂා කැරිණි.

අධ්‍යයනයට භාජනය වූ එකතුවල අන්තර්ගත පුස්කොළ ග්‍රන්ථවල විෂය ක්ෂේත්‍ර හඳුනාගැනීමට අතරේකව ඒවායේ ග්‍රන්ථ විද්‍යාත්මක ලක්ෂණයන් කෙරෙහි සුවිශේෂි අවධානයක් යොමු කරන ලදී. පුස්කොළ පොත් පිළිබඳ ක්‍රමවත් ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර විධිමත් පරිදි වාර්තාගත නොකිරීම හේතුවෙන් එවා කෙරෙහි වන ප්‍රවේශයට බාධා පැන නගී. පුස්කොළ ග්‍රන්ථ සම්බන්ධව විස්තර කිරීමේදී අවධානය යොමු කළ යුතු ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර කවරේ ද යන්න පිළිබඳ නිශ්චිත ප්‍රමිතියක් නොවීම මේ ගැටලුව උග්‍ර වීමට හේතුවක්ව පවතී.

එහෙයින් මේ පර්යේෂණයේදී පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර වාර්තා ගත කිරීමේ දී භාවිත කළ යුතු විස්තරාංග ඒකී විස්තරාංග ගොනු කළ යුතු අනුක්‍රමය, සමස්ත සංලේඛාවලිය පෙළ ගැස්වීමේ විධි ක්‍රමය යන කරුණු කෙරෙහි විශේෂිත අවධානයක් යොමු කරමින් අදාළ විහාරස්ථාන ද්වයෙහි එකතු පිළිබඳ සවිස්තරාත්මක ග්‍රන්ථ නාමාවලියක් ද සම්පාදනය කරන ලදී. ශ්‍රී ලංකාවේ පුස්කොළ ලේඛන කලාවේ ප්‍රභවය හා විකාශයට අදාළ පසුබිම් තොරතුරු ගවේෂණයෙන් ඉක්බිති පුස්කොළ පොත්වල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු හා ප්‍රමිති පිළිබඳ කරුණු දැක්වීමක් සිදු කොට ඇත්තේ ශ්‍රී ලංකාවට යෝග්‍ය පරිදි ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රමිතියක් බිහි කර ගැනීමේ අවශ්‍යතාව සලකා එය අවධාරණය කර ගනු පිණිස ය.

අධ්‍යනයේ නිගමන වශයෙන් පැහැදිලි වුයේ මෙරටට අනන්‍ය වූ ග්‍රන්ථ සම්ප්‍රදායක් තහවුරුව පැවති බවයි. එම සම්ප්‍රදායට අයත් ලක්ෂණ මෙහිදි හඳුනා ගනු ලැබිණි, එසේ ම පුස්කොළ ලේඛන කලාවට විශේෂිත අක්ෂර රටා, අංකන රටා හා ආකෘතික ලක්ෂණ ද මේ අධ්‍යයනයේදි හෙළි කර ගත හැකි විණි. පොදුවේ සලකන විට මේ විහාරස්ථාන ගත එකතු ක්‍රමයෙන් හානියට පත්වෙමින් පවත්නා අතර ඒවා සංරක්ෂණයකොට පවත්වා ගැනිමේ වැඩපිළිවෙළක අවශ්‍යතාවය ද මෙහිදි අවධාරණය කැරිණි.

**මුඛ්‍ය පද** - පුස්කොළ පොත්, ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රමිති, ග්‍රන්ථ නාමාවලි, සංරක්ෂණය, ලේඛන කලාව